# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2016 දෙසැම්බර්

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2016 දෙසැම්බර් මාසයේ වාර්ෂික උද්ධමනය 4.2%ක් ලෙස ගණනය කර ඇති බව ප්‍රකාශ කලේය. 2016 නොවැම්බර් මාසයේ උද්ධමනය 4.1%ක් විය. 2016 දෙසැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 1.06%ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.18%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 දෙසැම්බර් මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 118.0ක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. දෙසැම්බර් මාසයේ දර්ශකය නොවැම්බර් මාසයේ දර්ශකය (116.6) හා සංසන්දනය කල විට 1.4ක දර්ශකාංක වැඩිවීමක් හා ප්‍රතිශතයක් ලෙස 1.2ක වැඩිවීමක් වාර්තා වේ. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 1.25%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.08%කින් අඩුවීම බලපා ඇත.

2016 නොවැම්බර් මාසය හා සසඳන කල 2016 දෙසැම්බර් මාසයේ ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා සහල්, පොල්, අළුත් මාළු, ලොකුළූණු, අර්තාපල්, පැපොල්, එළවළු, බිත්තර, පොල්තෙල්, අමු මිරිස් සහ හරක් මස් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් දෙහි, කුකුල් මස්, කෙසෙල්, අඹ, වියළි මිරිස්, අන්නාසි සහ කරවල යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සසඳන කල 2016 දෙසැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය’, ‘විනෝදාත්මක හා සංස්කෘතික’, සහ ‘නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන’ යන කාණ්ඩවල වියදම්වල වටිනාකම අඩුවීම බලපා ඇත. එසේ වුවත් ‘ආපනශාලා හා හෝටල්’, ‘ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු’, ‘ප්‍රවාහන’ සහ ‘රෙදිපිළි හා පාවහන්’යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවී ඇත. පසුගිය මාසය හා සසඳන කළ ‘විවිධ භාණ්ඩ හා සේවා’ කාණ්ඩයේ වියදම්වල වටිනාකම ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. ‘සෞඛ්‍ය’, ‘සන්නිවේදන’, ‘අධ්‍යාපන’ යන කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | මිල දර්ශකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | වාර්ෂික උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2015** | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 |
| **2016** | ජනවාරි | 112.0 | -1.1 | -0.7 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 |
| | ජුනි | 116.1 | 2.1 | 6.4 |
| | ජූලි | 115.2 | -0.8 | 5.8 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 |
| | සැප්තැම්බර් | 113.5 | 0.2 | 4.7 |
| | ඔක්තෝම්බර් | 114.7 | 1.1 | 5.0 |
| | නොවැම්බර් | 116.6 | 1.7 | 4.1 |
| | දෙසැම්බර් | 118.0 | 1.2 | 4.2 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දුරකථන අංක: 011-2147001 / 011-2147020